රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව සுதந்திர சதுக்கம், கொழும்பு 07,இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சு / E-mail: info@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Telephone: www.pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No: MPA/SSD/12/RECRU/9938(IV)
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.11.25

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ
ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් වෙත

**<u>ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්වීම හා විශේෂ ශ්‍රේණියේ අතිරේක වන සංරක්ෂක ජනරාල් (වන ආරක්ෂණ, මෙහෙයුම් හා කළමනාකරණ) හා අතිරේක වන සංරක්ෂක ජනරාල් (පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු) තනතුරුවලට පත් කිරීම</u>**

උක්ත කරුණට අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා විශේෂ ශ්‍රේණියේ අතිරේක වන සංරක්ෂක ජනරාල් (වන ආරක්ෂණ, මෙහෙයුම් හා කළමනාකරණ) හා අතිරේක වන සංරක්ෂක ජනරාල් (පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු) තනතුරට පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් සම්පූර්ණ කල නිලධරයන්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකි බව කාරුණිකව දන්වා සිටිමි.

03. තවද මීට අදාළ අයදුම්පත්‍රය www.pubad.gov.lk ඔස්සේ ද බා ගත කල හැකිය.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරුවලට පත් කිරීම

අංක 1877/27 දරන 2014 අගෝස්තු මස 28 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද, අංක 1996/25 දරන 2016 දෙසැම්බර් මස 06 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධනය කරන ලද 2006.01.01 දින සිට බලාත්මක වන ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3 වගන්තිය හා අනුමත බඳවා ගැනීම් පරිපාටිවල විධිවිධාන ප්‍රකාරව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින අතිරේක වන සංරක්ෂක ජනරාල් (වන ආරක්ෂණ, මෙහෙයුම් හා කළමනාකරණ) හා අතිරේක වන සංරක්ෂක ජනරාල් (පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු) තනතුරුවල පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධරයන් එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරට පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පුරප්පාඩු සංඛ්‍යාව:

| අනු අංකය | අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | කාරණය |
|---|---|---|---|---|
| 01 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | අතිරේක වන සංරක්ෂක ජනරාල් (වන ආරක්ෂණ, මෙහෙයුම් හා කළමනාකරණ) | 01 | විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරට පත් කිරීම |
| | | අතිරේක වන සංරක්ෂක ජනරාල් (පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු) | 01 | විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරට පත් කිරීම |

02. උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්.

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් හෝ වන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

II. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන ඇති නිලධරයෙකු වීම.

III. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ වසර 18කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහක් (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ: 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල

දඩුවමක් ලබා නොතිබීම.

VI.

| අනු අංකය | දෙපාර්තමේන්තුව / අමාත්‍යාංශය | තනතුර | සුදුසුකම |
|---|---|---|---|
| 02 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | අතිරේක වන සංරක්ෂක ජනරාල් (වන ආරක්ෂණ, මෙහෙයුම් හා කළමනාකරණ) | I සිට V දක්වා සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වීම සහ වන සංරක්ෂක (ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීම /සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති / වන විද්‍යා හා වන කළමනාකරණ / සැලසුම් හා ප්‍රගති පාලන / පරිසර කළමනාකරණ හා භූ සම්පත් / වන සංගණන හා භූ විද්‍යා තොරතුරු / පාරිසරික සංචාර / ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ) යන තනතුරක සේවයේ නියුතු නිලධරයෙකු වීම. |
| | | අතිරේක වන සංරක්ෂක ජනරාල් (පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු) | I සිට V දක්වා සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වීම සහ වන සංරක්ෂක (අධ්‍යාපන සහ ධාරිතා සංවර්ධන/ පර්යේෂණ) යන තනතුරක සේවයේ නියුතු නිලධරයෙකු වීම. |

03. උසස් කිරීමේ ක්‍රමය.

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර එහි ප්‍රතිඵල හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.

(ii) සම්මුඛ පරීක්ෂණයේදී යෝග්‍යතාව හා කුසලතාව ඇගයීමට ලක් කරනු ලැබේ. ඒ සඳහා ඇමුණුම I හි වන ලකුණු පරිපාටිය යොදා ගනු ලැබේ.

04. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1877/27 දරන 2014.08.28 දිනැති ගැසට්පත්‍රයේ පළ කරන ලද) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාවේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද යටත්ව, ඉහත කී සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව තෝරා ගනු ලබන නිලධරයින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ දිනයේ සිට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

05. සම්මුඛ පරීක්ෂණයේ දී එක් එක් තනතුරට අදාළව ඉහළම ලකුණු ලබාගෙන ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධරයා / නිලධරයින් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් බලධරයා වන තනතුරු සඳහා අදාළ තනතුරුවල රාජකාරි භාර ගන්නා දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ තනතුරුවලට පත් කිරීම එම කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

06. මෙම නිවේදනයේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරාලන දැනට සක්‍රීය සේවයේ නිරත නිලධරයන්

පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

07. පහත ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට අත්සන් කර එම අත්සන දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කර දෙපාර්තමේන්තු ප්‍රධානීගේ නිර්දේශය ද සහිතව, ලියාපදිංචි තැපෑලෙන් 2024.12.03 දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිදි “ ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය ,කොළඹ 07 ” යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි “ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම” යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර නොගන්නා අතර, අයදුම්පත්‍ර අස්ථානගත වීම හෝ ප්‍රමාදවීම සම්බන්ධයෙන් පැමිණිලි ද භාර ගනු නොලැබේ.

08. මෙම නිවේදනයෙහි සිංහල, දෙමළ, ඉංග්‍රීසි පිටපත්වල කරුණු අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල පිටපත බලාත්මක වේ.

අයදුම්පත්‍රය www.pubad.gov.lk ඔස්සේ ද බා ගත කල හැකිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
2024 නොවැම්බර් මස 25 දින

**<u>ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරට පත් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටිය</u>**

**01. ජ්‍යෙෂ්ඨතාව** **ලකුණු 70**

- ජ්‍යෙෂ්ඨතම නිලධාරියා සඳහා උපරිම ලකුණු ප්‍රමාණය ලබා දෙනු ලැබේ.
- අනෙකුත් නිලධරයන් සඳහා ජ්‍යෙෂ්ඨතාවය = (ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු / ජ්‍යෙෂ්ඨතම නිලධරයාගේ අමතර සේවා කාලය (අවුරුදු x12+මාස)) x අදාළ නිලධරයාගේ අමතර සේවා කාලය (අවුරුදු x12+මාස)

**02. කුසලතාව** **ලකුණු 30**

I.

| | | **උපරිම ලකුණු** |
|---|---|---|
| I. | ක්ෂේත්‍රයට අදාළව කේවල හෝ කණ්ඩායම් වශයෙන් සිදු කරන ලද;<br>➢ පර්යේෂණාත්මක ප්‍රකාශන (Research Publication) (කණ්ඩායම් ප්‍රකාශන සඳහා අදාළ නිලධරයාගේ මූලිකත්වයෙන් කරනු ලැබූ ප්‍රකාශන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තහවුරු කළ යුතුය) - එක් ප්‍රකාශනයක් සඳහා ලකුණු 02 බැගින් (උපරිම ප්‍රකාශන 2 ක් සඳහා) | 04 |
| II. | සාරාංශ (Abstract)<br>➢ ශ්‍රී ලංකාව තුළ (Local ) - එක් සාරාංශයක් සඳහා ලකුණු 01 බැගින් (උපරිම සාරාංශ 2ක් සඳහා)<br>➢ ජාත්‍යන්තර (International ) - එක් සාරාංශයක් සඳහා ලකුණු 02 බැගින් (උපරිම සාරාංශ 2ක් සඳහා) | 02<br>04 |
| III. | නිබන්ධන - එක් නිබන්ධනයක් සඳහා ලකුණු 02 බැගින්<br>( දෙවන කාර්යක්ෂමතා කඩඉම හෝ I ශ්‍රේණියට උසස්වීමට සලකනු ලැබූ පශ්චාත් උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනය හැර වෙනත් නිබන්ධන සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)<br>(උපරිම නිබන්ධන 1ක් සඳහා) | 02 |
| IV. | නව්‍යතා / නවෝත්පාදන - අදාළ නිලධරයාගේ මූලිකත්වයෙන් සාර්ථකව ක්‍රියාත්මක වූ නවෝත්පාදනයන් බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තහවුරු කළයුතු වේ (එක් නව්‍යතාවක් / නවෝත්පාදනයක් සඳහා ලකුණු 3 බැගින්)<br>(උපරිම නව්‍යතා / නවෝත්පාදන 2ක් සඳහා) | 06 |
| V. | පුවත්පත් / සඟරා ලිපි - තමා විසින් ජනතාව දැනුම්වත් කිරීමට ලියන ලද ලිපි ලේඛන (එක් පුවත්පතක් / සඟරාවක් සඳහා ලකුණු 01 බැගින්)<br>(උපරිම පුවත්පත් / සඟරා ලිපි 2ක් සඳහා) | 02 |
| මුළු ලකුණු | | 20 |

II. තෝරා පත් කරන තනතුරෙහි කාර්ය භාරය සඳහා දායකත්වය දක්වන ආකාරය සම්බන්ධයෙන් පරිගණකය ආශ්‍රයෙන් සිදු කරනු ලබන විනාඩි 10ක ඉදිරිපත් කිරීම (Power Point Presentation) (ලකුණු - 10)

| | | | |
|---|---|---|---|
| i. | අදාළත්වය (Relevancy) | - | ලකුණු 02 |
| ii. | නිර්මාණශීලීත්වය / (Creativity ) | - | ලකුණු 02 |
| iii. | ඒ සඳහා හඳුන්වාදෙන නව්‍යතා හා නව යෝජනා (Innovations & Suggestions) | - | ලකුණු 02 |
| iv. | කාල කළමනාකරණය (Time Management) | - | ලකුණු 02 |
| v. | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව (Proficiency in English) | - | ලකුණු 02 |

සටහන -

අ) ඉහත (v) නිර්ණායකය යටතේ ලකුණු ලබා ගත හැක්කේ අයදුම්කරු ඉංග්‍රීසි භාෂාව මඟින් මෙම ඉදිරිපත් කිරීම සිදු කරන්නේ නම් පමණි.

ආ) ඉදිරිපත් කිරීමට අදාළ දෘඩ පිටපත (Hard Copy) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය. අමතර වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකසන ලද ඉදිරිපත් කිරීමේ දෘඩ පිටපතක් ද මෙම අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

**ආදර්ශ අයදුම්පත්‍රය**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්වීම හා විශේෂ ශ්‍රේණියේ අතිරේක වන සංරක්ෂක ජනරාල් (වන ආරක්ෂණ, මෙහෙයුම් හා කළමනාකරණ) සහ අතිරේක වන සංරක්ෂක ජනරාල් (පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු) තනතුරුවලට පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම

1. නිලධරයා සම්බන්ධ තොරතුරු
   i. සම්පූර්ණ නම: (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):.........................................................................
   ..........................................................................................................................
   (උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
   ii. මුලකුරු සමඟ නම: ( ඉංග්‍රීසි කැපිටල් අකුරින්)Mr./Mrs./Miss:.........................................
   ..........................................................................................................................
   (උදා: GUNAWARDHANA, H. M. S. K.)
   iii. සම්පූර්ණ නම (සිංහලෙන්):.........................................................................................
   ..........................................................................................................................
   iv. උපන් දිනය:...............................................................
   v. අයදුම්පත භාර ගන්නා අවසන් දිනට වයස: අවු........... මාස................දින..................
   vi. ජාතික හැඳුනුම්පත් අංකය : ............................
   vii. ස්ථිර ලිපිනය :..............................................................................................................
   ..........................................................................................................................
   viii. දුරකථන අංකය : කාර්යාලය : ........................... ජංගම :....................................
   ix. විද්‍යුත් ලිපිනය:……………………………………………………………………
2. තනතුර පිළිබඳ තොරතුරු :
   i. වර්තමාන සේවා ස්ථානය හා ලිපිනය :
   ii. III ශ්‍රේණියට පත්වීම් ලබා ඇති දිනය :
   iii. II ශ්‍රේණියට පත්වීම් ලබා ඇති දිනය :
   iv. I ශ්‍රේණියට පත්වීම් ලබා ඇති දිනය:
   v. දැනට දරන තනතුර:
   vi. එම තනතුරට පත් වූ දිනය:
   vii. 2024.12.03 දිනට III ශ්‍රේණියේ සේවා කාලය :
   viii. 2024.12.03 දිනට I ශ්‍රේණියේ සේවා කාලය :
3. ජ්‍යෙෂ්ඨතාව

| | | |
|---|---|---|
| 01 | අයදුම්පත් කැඳවන අවසාන දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය | |
| 02 | අයදුම්පත් කැඳවන අවසාන දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය | |
| 03 | වැටුප් රහිත නිවාඩු ලබා ඇති / නැති බව (වැටුප් | |

| | | |
|---|---|---|
| | රහිත නිවාඩු ලබා ඇත්නම් ලබා ඇති දින සඳහන් කරන්න) | |

4. ක්ෂේත්‍රයට අදාළ සුදුසුකම්:

4.1. අදාළ ක්ෂේත්‍රය සඳහා දක්වන ලද විශේෂ දායකත්වය

| **පර්යේෂණ හා ප්‍රකාශන** | | **විස්තර** | **අදාළ වර්ෂය** |
|---|---|---|---|
| පර්යේෂණාත්මක ප්‍රකාශන | | | |
| සාරාංශ | ශ්‍රී ලංකාව තුළ | | |
| | ජාත්‍යන්තර | | |
| නිබන්ධන | | | |
| නව්‍යතා/ නවෝත්පාදන | | | |
| පුවත්පත් ලිපි | | | |

❖ පර්යේෂණ සාරාංශය සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.

**5.** අයදුම්කරුගේ ප්‍රකාශය :

ඉහත සඳහන් තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය : .............................. .........................................

අයදුම්කරුගේ අත්සන

II කොටස

(දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කළයුතු වේ.)

.............................................................................. දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ නිලධාරී ............................................................................................................ මයා / මිය/ මෙනවිය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පතෙහි සඳහන් තොරතුරු පෞද්ගලික ලිපිගොනුවෙහි ඇති තොරතුරු අනුව නිවැරදිය / වැරදිය. ඔහුට / ඇයට විරුද්ධව විනය ක්‍රියාමාර්ග කිසිවක් නොමැති / ගෙන ඇති බවත්, එවැනි ක්‍රියාමාර්ග ඉදිරියේ දී ගැනීමට අදහස් කර නොමැති / ඇති බවත්, අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 05ක වැටුප් වර්ධක උපයාගෙන ඇති / නැති බවත්, කාරුණිකව දන්වා සිටිමි. ඔහුගේ / ඇයගේ අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.

.........................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව

දිනය